Diploma in Criminal Psychology and Offenders Counselling

අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව

2024/2025 - Intake 04

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදුකරන බැවින් ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

### පියවර 01

- ඔබ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් 1000 ක් ගෙවීම අනිවාර්ය වේ. (මහජන බැංකුව - ගංගොඩවිල ශාඛාවට බැර වෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මෙම මුදල් තැන්පත් කිරීම සිදුකළ හැකිය.)

| පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|
| අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව (Intake 04) | 013010001546 |

- මුදල් තැන්පතු රිසිට් පතේ පාඨමාලාවට අයදුම් කරන්නාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.
- බැංකු රිසිට් පතෙහි ඡායා පිටපතක් ඔබ ළඟ තබාගත යුතුය.
- ඔබ විසින් ගෙවන ලද අයදුම්පත් ගාස්තුව කිසිම හේතුවක් මත නැවත නොගෙවෙන බව ද දන්වා සිටිමු.

පාඨමාලා ගාස්තුව ඔබට වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය (රුපියල් 40000 ක්) පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතු අතර දෙවන වාරිකය (රුපියල් 35000 ක්) පාඨමාලාව ආරම්භ වී මාස තුනක් ඇතුළත ගෙවිය යුතුය. (පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් එක් සිසුන්ට අනන්‍ය වූ බැංකු ගිණුම් අංක පවතින අතර අදාළ ගිණුම් අංක පාඨමාලාව සඳහා තේරී පත් වූ පසු ඔබට ලබාදෙනු ඇත.)

### පියවර 02

ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත ලින්ක් එකට පිවිස පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න.

- https://forms.gle/GsMKThXx2NT5gc5v7

**පියවර 03**

ලබා දී ඇති අයදුම්පත්‍රය අයදුම්කරුට එක් වරක් පමණක් පිරවිය හැකි බැවින් එය ඉතාමත් සැලකිලිමත්ව පිරවීමට වගබලා ගන්න. ඔබගේ නිවැරදි තොරතුරු පමණක්, ලබා දී ඇති ගූගල් පෝරමයේ නිවැරදි ස්ථානයේ නියමිත පරිදි සම්පූර්ණ කරන්න.

එසේ ම ඔබගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අඩංගු විය යුතු පහත සඳහන් ලේඛනවල මුල් පිටපත්වල (Original certificate) පී.ඩී.එෆ් (PDF) ලෙස පමණක් උඩුගත (Upload) කළ යුතුය. පහත ලිපිගොනු උඩුගත කිරීමට ප්‍රථමයෙන් එම පී.ඩී.එෆ් (PDF) ලිපිගොනු ඔබගේ නමින් නම් (Rename) කිරීම සිදුකළ යුතුය.

I. ජාතික හැඳුනුම්පත් පිටපත (මුලකුරු සමඟ නම 01 - M.L Perera 01)
II. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතික පිටපත් (මුලකුරු සමඟ නම 02 - M.L Perera 02)
III. වෙනත් අධ්‍යාපන සුදුසුකම් වල සහතික පිටපත්
IV. සේවා සහතිකය
V. මුදල් ගෙවන ලද ලදුපතෙහි පිටපත

**පියවර 04**

අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපෑල වෙත අප විසින් එවන ලද ඔබගේ අයදුම් පත්‍රයේ පිටපත භාගත (Download) කරගැනීම කළ යුතුය.

**පියවර 05**

එසේ භාගත කරගත් අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑල හරහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උඩුගත කරන ලද මුල් සහතිකපත්හි සත්‍ය පිටපත් (True copy) බවට සහතික කරන ලද පිටපත් සමඟ අමුණා පහත ලිපිනයට 2024.10.15 දින හෝ එදිනට පෙර සැලැස්විය යුතුය. (සැ.යු - ඔබගේ සහතිකවල මුල් පිටපත් එවීම අවශ්‍ය නොවේ. මුල් පිටපත් අදාල සම්මුඛ පරීක්ෂණයේදී පමණක් පරීක්ෂා කරනු ලැබේ.)

**පාඨමාලා සමායෝජක,**

**අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**

**ගංගොඩවිල,**

**නුගේගොඩ.**

Diploma in Criminal Psychology and Offenders Counselling
අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව
2024/2025 - Intake 04

සැ.යු - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ''**අපරාධ මනෝ විද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025**'' ලෙස සඳහන් කළ යුතුය.

**පොදු උපදෙස්**

- මෙම උපදෙස් මාලාවට අනුකූල නොවන ලෙස එවන අයදුම්පත්‍ර සහ 2024.10.15 දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.
- ඔබගේ අයදුම්පත්‍රය අනුව අදාළ පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණයට ඔබව තෝරාගනු ලැබුවහොත් ඒ බව පෞද්ගලිකව දන්වනු ලබන අතර පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය.
- පාඨමාලා ගාස්තු තම සේවායෝජකයා මගින් ගෙවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් තම අයදුම්පත් තම සේවා යෝජකයා මගින් එවීම ප්‍රයෝජනවත් විය හැකිය.

*****************************************************************